ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய செயலகம்
**National Secretariat for Elders**
ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
**Ministry of Rural Development, Social Security and Community Empowerment**

*සක්‍රිය වැඩිහිටි වියක් උදෙසා* -செயலூக்கமான முதுமையை நோக்கி - *Towards an active ageing*

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. : NSE/DEV/ESSF/8 | ඔබේ අංකය / உனது இல. / Your No. | දිනය / திகதி / Date : 2025.05.22 |

දිස්ත්‍රික් ලේකම්,

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

.........................................

<u>ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන වැඩිහිටි වැඩිහිටි දිවා මධ්‍යස්ථාන ඉදිකිරීම / අලුත්වැඩියා කිරීම 2025</u>

ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 2025 වර්ෂය තුළ නව ඉදිකිරීම් හා අළුත් වැඩියා කිරීමට වැඩිහිටි දිවා මධ්‍යස්ථානවල 20 ක් වෙනුවෙන් එක් වැඩිහිටි දිවා මධ්‍යස්ථානයකට රුපියල් මිලියන 3.5 ක උපරිමයකට යටත්ව ප්‍රමුඛතාවය මත ආධාර මුදල් ලබා දීමට වැඩිහිටි තැනැත්තන්ගේ සුබ සාධනය සඳහා වූ ජාතික අරමුදලේ මුදල් 2025 වර්ෂය සඳහා ද වෙන් වී ඇත.

02. ඒ අනුව උක්ත වැඩසටහනට අදාල උපදෙස් පත්‍රිකාව (ඇමුණුම -1) මේ සමඟ අමුණා ඇති අතර,ඊට අනුකූලව සුදුසුකම් සපුරාලන වැඩිහිටි දිවා මධ්‍යස්ථානවල නව ඉදිකිරීම් හා අලුත්වැඩියාවන් සම්බන්ධයෙන් මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රයට අනුව සම්පූර්ණ කර සහ ඊට අනුකූලව සකස් කරන ලද විධිමත් ඇස්තමේන්තුවද සමඟ 2025.06.30 වන දිනට පෙර මා වෙත එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

03. එමෙන්ම මෙම කාර්යය කෙරෙහි ඔබගේ පෞද්ගලික අවධානය යොමු කර දිස්ත්‍රික්කය තුල ජීවත්වන වැඩිහිටි ප්‍රජාවගේ සාමූහික අවශ්‍යතා වෙනුවෙන් මෙම ආධාරය ලබා දීමට වඩාත්ම සුදුසු වැඩිහිටි දිවා මධ්‍යස්ථාන තෝරා එවන මෙන් ඉල්ලා සිටිමි.

05.මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය අගය කොට සලකමි.

කේ.චතුර මිහිඳුම්
අධ්‍යක්ෂ

ලිපිනය : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල.
முகவரி : 2ஆம் மாடி,தொகுதி D,செத்சிறிபாய-கட்டம் II,பத்திரமுல்லை
Address : 2nd Floor,Block D, Sethsiripaya- II Stage, Baththaramulla.
ඊ-මේල්/ ஈ-மெயில்/ E-mail : nsemss@gmail.com
ෆැක්ස්/ பெக்ஸ் / Fax : 0112187015

දුරකථන / தொலைபேசி/ Telephone:
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 0112187045
කාර්යාලය / அலுவலகம் / Office
සංවර්ධන අංශය :0112054164
ආයතන අංශය :0112054136
ගිණුම් අංශය : 0112054138

ඇමුණුම - 1

**වැඩිහිටි දිවා මධ්‍යස්ථාන ඉදිකිරීමට අළුත් වැඩියා කිරීමට,අරමුදල් නිදහස් කිරීම - 2025**

**හැඳින්වීම**

ග්‍රාමීය මට්ටමේදී වැඩිහිටියන්ගේ සුබසාධන, ආදායම් උත්පාදන වැඩසටහන් හා අධ්‍යාත්මික වැඩසටහන් පැවැත්වීමට මෙන්ම සාමූහික ඒකාබද්ධ ප්‍රවේශයකින් සංවර්ධන වැඩසටහන් සඳහා දිවා මධ්‍යස්ථාන ප්‍රදේශයේ වැඩිහිටි පිරිසට ඉතා ප්‍රයෝජනවත් වේ. පොදු කණ්ඩායමක් ලෙස එක් රැස් වී තම අනන්‍ය වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මෙන්ම සමවයස් කණ්ඩායමක් වශයෙන් ගෞරවනීය දිවි පැවැත්මට මෙම වැඩිහිටි දිවා මධ්‍යස්ථානවලින් ලැබෙන පිටු බලය නිසා සමාජයේ වැඩිහිටියාට තමා පිළිබඳ යහපත් හැඟීමක් සමාජයට ලබාදීමට මේ නිසා හැකිවිනු ඇත.

අරමුණ

2011 අංක 05 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් සංශෝධිත වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13 වගන්තියේ එ වගන්තිය හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ 13 වගන්තියේ ඒ උපවගන්තිය, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් පිළිබඳ ජාතික ප්‍රඥප්තිය සහ ජාතික ප්‍රතිපත්තියේ 4 වැනි උපාය මාර්ගයේ 4.2 අනු වගන්තිය අනුව වැඩිහිටියන් උදෙසා දිවා මධ්‍යස්ථාන පහසුකම් සැපයිය යුතුය. තවද "පොහොසත් රටක් ලස්සණ ජීවිතයක්" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ගෞරවනිය ජීවිතයක් සුරක්ෂිත රටක් සඳහා පරපුරක් තැනූ පරපුරක් වන වැඩිහිටියාගේ යහපත් සමාජ තත්වයක් ඇති කිරීම ද ප්‍රධාන අරමුණකි.

1. වැඩිහිටි නිවාස ගතවීම වෙනුවට වැඩිහිටියාට තම දූ, දරු, ඥාතී ,ඇතුලු ආදරණීය සමූහයේම ජීවත්වීමේ අවස්ථාව තවදුරටත් ලබාදීම
2. සම වයස් කණ්ඩායමක් වශයෙන් දැනුම බෙදා ගැනීමට අත්දැකීම් හුවමාරුවට අවස්ථාවක් ලබාදීම.
3. දිවා මධ්‍යස්ථාන ජාලය හරහා ආදායම් උත්පාදක කුඩා ව්‍යාපෘති ක්‍රියා.්මක කිරිමට අවස්ථාව සැලසෙන බැවින් හැකියාවැති වැඩිහිටියන්ට ආදායම් උත්පාදන අවස්ථා බිහිවී ඔවුන් සවිබල ගැන්වීම.
4. ග්‍රාමීය පොදු මධ්‍යස්ථාන වශයෙන් වැඩිහිටියන්ගේ ආර්ථික, සෞඛ්‍යය , සෞන්දර්යාත්මක, හා අධ්‍යාත්මික වැඩසටහන් පවත්වන ස්ථානයක් ලෙස ගම තුළ ක්‍රියාත්මක වීම.
5. වැඩිහිටි ප්‍රජාවගේ දැනුම හා අත්දැකීම් මතු පරපුර වෙත ලබාදීමට මෙන්ම වැඩිහිටි භාවය පිළිබඳ සමාජය දැනුම්වත් කරන සම්පත් මධ්‍යස්ථානයක් ලෙස දිවා මධ්‍යස්ථා ක්‍රියාත්මක කිරීම

ග්‍රාමීය මට්ටමේදී වැඩිහිටියන්ගේ සුබසාධනය, ආදායම් උත්පාදන හා අධ්‍යාත්මික වැඩසටහන් පැවැත්වීමට මෙන්ම ඒ, ඒ සංවිධාන වෙත ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය, වෙනත් පරිත්‍යාගශීලීන් හා රාජ්‍යය නොවන සංවිධාන යනාදියෙන් ලබාදෙන භෞතික සම්පත් ආරක්ෂා සහිතව ප්‍රයෝජනයට ගැනීමට ද මෙම මධ්‍යස්ථාන, ප්‍රදේශයේ වැඩිහිටි පිරිසට ඉතා ප්‍රයෝජනවත් වේ

නිර්ණායක

1. ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ලියාපදිංචි, සක්‍රිය වැඩිහිටි සමිතියකට සම්බන්ධ දිවා මධ්‍යස්ථානයක් විය යුතුයි.
2. නව ඉදිකිරීම් හා අළුත් වැඩියා යන අංශ දෙකටම මුදල් ඉල්ලුම් කළ හැකිය.
3. රජය සතු භූමියක හෝ රජය සතු නමුත් දැනට . දැනට අත්හැර දමා ඇති නිර්කාර්ාය ගොඩනැගිලිවල ඉදිකිරිමට මුදල් ඉල්ලුම් කළ හැකිය.
4. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හැර වෙනත්රාජ්‍ය ආයතනයකට අයත් ඉඩමක් නම් ඉදිකරන්නේ නම් ප්‍රාදේශීය ලේකම්වරයා සමග පොදු එකගතාවයන් මත ගිවිසුම් ගත වීමෙන් පසුව මුදල් ලබාදිය හැකිය.
5. පෞද්ගලික ඉඩමක ඉදිකරන්නේ නම් එම කොටස ප්‍රාදේශීය ලේකම්වරයා වෙත පවරා දිය යුතුය.
6. අදාල ඉඩම පර්චස් 10 හෝ ඊට වැඩි විය යුතුය. (අදාල ඉඩම පර්චස් 10 ට වඩා අඩු වන අවස්ථාවකදී වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ විශේෂ අනුමැතිය මත ඉදිකිරීමට අවස්ථාව ලබාදිය හැකිය.)
7. දිවා මධ්‍යස්ථානය වෙත පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා අඩි 12 ක් හෝ ඊට වැඩි පිවිසුම් මාර්ගයක් තිබිය යුතුය
8. හිතකර පරිසරයක් විය යුතුය.
9. ඉදිකිරීමෙන් පසු ජල හා විදුලි බිල්පත් අදාළ වැඩිහිටි සමිතිය විසින් දැරිය යුතුය
10. දිවා මධ්‍යස්ථානයේ හා භෞතික සම්පත්වල ආරක්ෂාව සම්බන්ධ විධිමත් වැඩ පිළිවෙළක් සකස්කර තිබිය යුතුයි
11. වෙනත් කාර්යයක් සඳහා දීර්ඝකාලිනව දිවා මධ්‍යස්ථානය සමගාමීව භාවිතා කරන්නේ නම් දිවා මධ්‍යස්ථානයේ කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු අතර ඒ සඳහා මධ්‍යස්ථානයේ එකඟතාවය, ප්‍රාදේශීය ලේකම් ගේ නිර්දේශය සමග වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අනුමැතිය ලබා ගත යුතුය.

ඉදිරිපත් කසළ යුතු ලේඛන

1. දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් නිර්දේශ සමග අදාළ වැඩිහිටි සංවිධානයේ ඉල්ලීම, නියමිත අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.
2. විධිමත් පිරිවැය ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුය
3. රජයේ ඉඩමක් නම් ඒ බවට ප්‍රාදේශීය ලේකම්වරයාගේ තහවුරු ලිපිය ඉදිරිපත් කළ යුතුය.
4. පොදු ඉඩමක / ප්‍රාදේශීය සභාව සතු ඉඩමක හෝවෙනත් ඉඩමක වැඩිහිටි දිවා මධ්‍යස්ථානයක් ඉදිකිරිම සඳහා ඒ වෙනුවෙන් එම භූමිය වෙන්කරන බවට ආදාල පාර්ශවකරුගේ පැවරුම් ලිපිය ඉදිරිපත් කළ යුතු අතර ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ගිවිසුම අත්සන් කළ යුතුය.
5. දිවා මධ්‍යස්ථානයක් ලබාදීමට සුදුසු බවට හා සක්‍රිය වැඩිහිටි සමිතියක් බවට ප්‍රාදේශීය ලේකම් ගේ නිර්දේශය සහිත විෂය භාර ක්ෂේත්‍ර නිලධාරී ගේ වාර්තාව ඉදිරිපත
6. වාරික දෙකකින් මුදල් ඉල්ලීම් යොමු කළ හැකිය.

- පළමු වාරිකය ලෙස (උපරිම මුදල) - රු. මි.1.5 ක් ලබා දේ

- දෙවන වාරිකය සම්පූර්ණ වැඩ අවසන්කිරීමෙන් පසුව මිල ගණන් සහිත වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසුව ඉතිරි මුදල වන රු. ම.2.0 ලබා දේ.

7. මහල් වශයෙන් ඉදිකරන්නේ නම් ප්‍රවේශ පහසුකම් වැඩිහිටියන්ට ගැළපෙන පරිදි සකස් කළ යුතුය. ( උදාහරණ ආරෝහණ - අවරෝහණ මාර්ග)

8. ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන බහුකාර්ය ගොඩනැඟිල්ලක් ලෙස ඉදිකිරීමේදී ගොඩනැඟිල්ලේ අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුවිය යුතුය

9. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන වියදම් ඇස්තමේන්තුව රු.මි. 3.5 ක උපරිම මුදල ඉක්මවා යන්නේ නම් එම මුදලට අදාළව වියදම සොයා ගන්නා ආකාරය පිළිබඳ පැහැදිලි කර වැඩිහිටි සංවිධානය විසින් ලිපියක් ඉදිරිපත් කළ යුතුය .

11. වැඩ අවසන් කරන ලද ගොඩනැඟිල්ලේ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ වැඩිහිටියන්ගේ සුබසාධනය සඳහා වන ජාතික අරමුදල මඟින් ඉදිකරන ලද බවට නාම පුවරුවක් සවි කල යුතුය.

12. ඒ ඒ අවස්ථාවේ පසු විපරම් කටයුතු දිස්ත්‍රික්වැඩිහිටි විෂය ආවරණය කරන නිලධාරියා විසින් සිදුකර ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඡායාරූප සහිත වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය

13. සියළුම වැඩිහිටියන්ට සම්බන්ධ විය හැකි විය යුතුයි.

**අධීක්ෂණය හා පසු විපරම්**

(1). මුදල් ලද බවට කුවිතාන්සිය (මුදල් ලැබී සති දෙකක් ඇතුළත) ඉදිරිපත් කල යුතුය

(2). කොන්ත්‍රාත් ගිවිසුමේ සහතික කළ පිටපත ඉදිරිපත් කළ යුතුය

(3). මාසික ප්‍රගති වාර්තාව (ඇමුණුම 1) ඉදිරිපත් කළ යුතුය

(4). ව්‍යාපෘති අවසන් වැඩ වාර්තාව (ඇමුණුම 2) ඉදිරිපත් කළ යුතු

(5). දිවා මධ්‍යස්ථානය ඉදිකරන ලද ගොඩනැඟිල්ල , වැඩිහිටි සමිතියට භාරදුන් බව සනාථ කරන ලිපිය ඉදිරිපත් කල යුතුය.

වැඩිහිටි දිවා මධ්‍යස්ථාන ඉදිකිරීමෙන් අනතුරුව එහි භාණ්ඩ ඉන්වෙන්ට්‍රියක් නඩත්තු කළ යුතු අතර, මධ්‍යස්ථානයේ යතුරු, පහසුවෙන් ගැනිමට හැකිවන පරිදි වැඩිහිටි සමිතියේ සුදුසු නිධාරියෙකු යටතේ තබා ගත යුතුය.

කේ.චතුර මිහිඳුම්
අධ්‍යක්ෂ

ඇමුණුම - 2

පිරික්සුම් ලයිස්තුව

| අනු අංකය | නිර්ණායකය | ඇත | නැත |
|---|---|---|---|
| 1. | සක්‍රීය වැඩිහිටි සමිතියකට සම්බන්ධ වැඩිහිටි දිවා මධ්‍යස්ථානයක් බවට වැඩිහිටි විෂය භාර ක්ෂේත්‍ර නිලධාරී වාර්තාව | | |
| 2. | ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ න් නිකුත්කරන ලද සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය අමුණා ඇත | | |
| 3. | නිසි පරිදි සම්පූර්ණ කරන ලද සහතික කරන ලද ඇස්තමේන්තුව අමුණා ඇත | | |
| 4. | ඉඩමේ අයිතිය රජය සතු බවට ඔප්පුවේ පිටපත | | |
| 5. | ඉඩමේ අයිතිය තහවුරු කිරීම සඳහා වූ සත්‍ය පිටපතක් බවට තහවුරු කරන ලද ඉඩමේ ඔප්පුව/ වැඩිහිටි සමිතිය සතු හෝ වෙනත් ඉඩමක් වන විට අයිතිය ප්‍රාදේශීය ලේකම්ට පවරා ඇති පැවරුම් ලිපිය | | |
| 6. | දිවා මධ්‍යස්ථානයේ ආරක්ෂාවට සකස්කර ඇති ක්‍රමවේදය පිළිබඳ තහවුරු ලිපිය | | |
| 7. | ඇස්තමේන්තුව රු.මි.3.5 ඉක්මවා යන්නේ නම් ඉතුරු මුදල සොයා ගන්නා ආකාරය සම්බන්ධ ලිපිය | | |
| 8. | බහු කාර්ය ගොඩනැගිල්ලක් වන අවස්ථාවක ප්‍රාදේශීය ලේකම් ගේ අනුමැතිය හා ක්‍රියාත්මක ක්‍රම වේදය | | |

..........................................................

වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරී/ සංවර්ධන නිලධාරී (වැඩිහිටි / සමාජ සේවා)

# දිවා මධ්‍යස්ථාන ඉදිකිරීම/අළුත්වැඩියා කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය
## பகல்நேர நிலையம் நிர்மானித்தலுக்கான விண்ணப்பப் படிவம்

1. දිස්ත්‍රික්කය/ மாவட்டம் :-
.............................................................................................................................

2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය /பிரதேச செயலாளர் பிரிவு:-
.............................................................................................................................

3. වැඩිහිටි දිවා මධ්‍යස්ථානයේ නම/ பகல்நேர நிலையத்தின் பெயர் :-
.............................................................................................................................
.............................................................................................................................

4. පවත්වාගෙන යනු ලබන වැඩිහිටි සංවිධානයේ නම / நடைமுறைப்படுத்திச் செல்லும் முதியோர் அமைப்பின் பெயர்:-
.............................................................................................................................
.............................................................................................................................

5. පවත්වාගෙන යනු ලබන වැඩිහිටි සංවිධානයේ ලිපිනය/ நடைமுறைப்படுத்திச் செல்லும் முதியோர் அமைப்பின் முகவரி :-
.............................................................................................................................
.............................................................................................................................

6. දුරකථන අංකය/ தொலைபேசி இலக்கம் :-

a. ස්ථිර/ நிரந்தரம் .................................... ජංගම/ நடமாடும் ..........................................................

7. දිවා මධ්‍යස්ථානය පිහිටි ඉඩම හා ගොඩනැගිල්ලේ අයිතිය/ பகல் நிலையம் அமையப் பெற்ற காணி மற்றும் கட்டிடத்தின் உரித்து :-

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය/ பிரதேதச செயலகம் .......................................................
- නගර සභාව / நகர சபை .......................................................
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ மாவட்டச் செயலகம் .......................................................
- පළාත් සමාජ සේවා දේපාර්තමේන්තුව/ மாகாண சமூக சேவைகள் திணைக்களம் .............................................................................................................
- වෙනත්./ வேறு ....................................................

8. දිවා මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ/ භූමියේ ප්‍රමාණය/ பகல் நேர நிலையம் அமையப் பெற்ற காணியின்/நிலத்தின் அளவு :-

නව ඉදිකිරීම ☐

අළුත්වැඩියා ☐

අක්කර/ ஏக்கர் ............. රූඩ් / றூட் .................. පර්චස්/ பேர்ச்சஸ்

9. දිවා මධ්‍යස්ථානයේ භාණ්ඩ හා යතුරු පවතින්නේ කා භාරයේද යන වග/ பகல் நேர நிலையத்தின் பொருட்கள் மற்றும் திறப்புக்கள் காணப்படுவது யாரிடம் என்பது தொடர்பானது :-

.......................................................................................................................................

- භාරකරුගේ නම/ பாதுகாவலரின் பெயர் :-

.......................................................................................................................................

.......................................................................................................................................

- භාරකරුගේ ලිපිනය/ பாதுகாவலரின் முகவரி :-

.......................................................................................................................................

- භාරකරුගේ දුරකථන අංකය / பாதுகாவலரின் தொலைபேசி இலக்கம்:-

a. ස්ථිර / நிரந்தரம் ........................................ b. ජංගම/ கையடக்கம் ........................................

- සමාජික සංඛ්‍යාව/ அங்கத்தவர் எண்ணிக்கை :- ..................................
- පවත්වන දින ගණන / நடாத்தப்படும் தினங்களின் எண்ணிக்கை:- ..........................................
- දැනට ලබාදෙන /පවතින පහසුකම්/ தற்போது வழங்கப்படும்/காணப்படும் வசதிகள் ..............................................................................................................................

(ඇමුණුමක් මගින් ඉදිරිපත් කරන්න/(இணைப்பினூடாக முன்வைக்கவும்.)

10. .......................................... කොට්ඨාශයේ .................................................... ග්‍රාම නිලධාරී වසමේ වැඩිහිටි දිවා මධ්‍යස්ථානය.................................................... මයා/මිය/මෙනවිය/ග්‍රාම නිලධාරී ...........................................................................................මයා භාරයේ පවත්වාගෙන යාම සඳහා වගකීම පවරා ඇත. මෙම දිවා මධ්‍යස්ථානය සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම සුදුසු බව නිර්දේශකර අනුමැතියට ඉදිරිපත් කරමි.

11. ......................................................................................................... பிரிவின் ........................................................................................ கிராம உத்தியோகத்தர் பிரிவின் திரு/திருமதி/செல்வி. .............................................................................................. அவர்களுக்கு, கிராம உத்தியோகத்தர் பொறுப்பில் பகல் நேர நிலையத்தினை முன்னெடுத்துச் செல்லுவதற்கு வழங்கப்பட்டுள்ள சகல பொருட்கள் உபகரணங்களின் பொறுப்பு ஒப்படைக்கப்பட்டுள்ளது. இப் பகல் நேர நிலையத்திற்கு நிதி ஒதுக்கீடு/பொருட்கள் மற்றும் உபகரணங்களை வழங்குவது பொருத்தமானது என பரிந்துரை செய்து அனுமதிக்காக முன்வைக்கின்றேன்

..........................................................................................

වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරී/ සංවර්ධන නිලධාරී (වැඩිහිටි / සමාජ සේවා /)
முதியோர் உரிமைகள் மேம்பாட்டு உத்தியோகத்தர்/அபிவிருத்தி உத்தியோகத்தர்(முதியோர்)/
சமூக சேவைகள் உத்தியோகத்தர்/அபிவிருத்தி உத்தியோகத்தர்( சமூக சேவை)

විෂය භාර ක්ෂේත්‍ර නිලධාරී ...............................................................................මහතා/මිය/මෙය විසින් නිර්දේශ කර ඇති ඇස්තමේන්තුව/ ප්‍රතිපාදන මුදල් /භාණ්ඩ හා උපකරණ ලබාදීමේ නිර්දේශය අනුමත කර ඉදිරි කටයුතු සඳහා අධ්‍යක්ෂ, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරමි.
விடயத்திற்குப் பொறுப்பான உத்தியோகத்தரான திரு/திருமதி./ செல்வி. ...................................................... அவர்களினால் பரிந்துரை செய்யப்பட்டுள்ள மதிப்பீடு/ஒதுக்கீட்டு நிதி/பொருட்கள் மற்றும் உபகரணங்களை வழங்கும் பரிந்துரையினை அங்கீகரித்து மேல் நடவடிக்கைக்கென பணிப்பாளர், முதியோர்களுக்கான தேசிய செயலகத்திற்கு முன்வைக்கின்றே

| ................................................ | ........................................... | ........................................... |
|---|---|---|
| අත්සන / ஒப்பம் | දින මුද්‍රව/ இறப்பர் முத்திரை | දිනය/ திகதி |

ප්‍රාදේශිය ලේකම් /பிரதேச செயலாளர்

.............................................................................ප්‍රාද්ශිය ලෙකම් විසින් නිර්දේශ කර ඇති ඇස්තමේන්තුව/ ප්‍රතිපාදන මුදල් / ලබාදීමේ නිර්දේශය අනුමත කර ඉදිරි කටයුතු සඳහා අධ්‍යක්ෂ, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරමි.

........................................................................................................................ என்ற பிரதேச செயலாளரினால் பரிந்துரை செய்யப்பட்டுள்ள மதிப்பீடு/ஒதுக்கீடு நிதி/பொருட்கள் மற்றும் உபகரணங்களை வழங்கும் பரிந்துரையினை அனுமதியளித்து மேலதிக நடவடிக்கைகளுக்காக பணிப்பாளர், முதியோர்களுக்கான தேசிய செயலகத்திற்கு முன்வைக்கின்றேன்.

| ................................................ | ........................................... | ........................................... |
|---|---|---|
| අත්සන / ஒப்பம் | නිල මුද්‍රව/ இறப்பர் முத்திரை | දිනය / திகத |

දිස්ත්‍රික් ලේකම් / மாவட்டச் செயலாளர்

ප්‍රතිපාදන ලබාදීම අනුමත කරමි/අනුමත නොකරමි/ ஒதுக்கீடுகள் வழங்குவதை அனுமதியளிக்கின்றேன் / அனுமதியளிக்கவில்லை

| ...................................................... | ..................................... |
|---|---|
| අධ්‍යක්ෂ/ பணிப்பாளர்,<br>වැඩිහිටි මහලේකම් කාර්යාලය<br>முதியோர்களுக்கான தேசிய செயலகம் | දිනය/ திகதி |